# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2080/62 - 2018 ජූලි මස 20 වැනි සිකුරාදා - 2018.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-4642
විශේෂ්‍ය අංකය :- ර/275

### 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය

මියගිය අසංකා අනෝමා විජේවර්ධන තෙන්නකෝන් ආදිහෙට්ටි යන අයගේ බූදලය සම්බන්ධයෙන් ඇයගේ දියණියක වන ගම්පොල දිසා විනිසුරු නිල නිවසෙහි පදිංචි ශ්‍යාමිනි තෙන්නකෝන් ආදිහෙට්ටි ගුණරත්න මහත්මිය. පනතේ 18 වන වගන්තිය යටතේ ප්‍රමාද ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත බලාත්මක වන දිනය වන විට ඇය සහ ඇගේ සහෝදර සහෝදරියන් බාලවයස්ව සිටි බැවින් සහ ඇගේ පියා ජීවත්ව සිටි බැවින්, පනතේ 19 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව, එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරු වන වෝල්ටර් දයාරත්න ආදිහෙට්ටි යන අයට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු බිම් කොටසින් කොටසක් නිශ්චය කර ඔහු මියගොස් ඇති බැවින් ඔහුගේ බූදලය නමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

සම්පත් සුභසිංහ ආරච්චි,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2018 ජූලි මස 17 වැනි දින,
නො : 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 180, පහල හකමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හකමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 18 අතිරේක අංක 34 පත්‍ර අංක 34 හි දැක්වෙන හකමුව වත්ත නැමැති ඉඩමේ කැබලි අංක 545, 548, 549, 552, 553, 554, 556, 558, 559 න් දැක්වෙන අක්කර : 22, රූඩ් : 3, පර්චස් 19.68 (හෙ:9.2563) ක ප්‍රමාණ ඇති බිම් කොටස් සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

08 - 217


1A - PG 4132 — 17 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*